


**රූප සෑදෙන ආකාරය අනුව හිස්තැනට ගැළපෙන රූපය තෝරන්න.**



1) 2) 3)




22.



මෙහි සිටින සමන්ට නිවසට යාමේදී වාර කීයක් වමට හැරී යා යුතු ද?

(1) 5 (2) 6 (3) 7

23. රට, පළාත, දිස්ත්‍රික්කය, ගම යන ඒවා අතර සම්බන්ධය දැක්වීමට මෙම රූපය ඇඳ තිබේ.





මෙහි A මගින් දක්වා ඇත්තේ කුමක් ද?

(1) පළාත

(2) දිස්ත්‍රික්කය

(3) ගම

24. පහත සෘජුකෝණාස්‍ර ඊතලය ඇති දෙසට නවා දෙවන රූපයේ ඇති තිත් ඉරි දිගේ කපා වෙන් කරන ලදී.



දැන් වෙන් වී යන ත්‍රිකෝණ ගණන වන්නේ,

(1) 2 (2) 4 (3) 3

- **රටාව අනුව අංක 25 සහ 26 ප්‍රශ්නවල හිස්තැනට තිබිය යුතු රූපය තෝරන්න.**

25.




(1) (2) (3)

26.



(1) (2) (3)

27. පහත රූප කොටස් එකතු කර සෑදිය හැකි ඝන වස්තුව වන්නේ,



(1) සිලින්ඩරය

(2) ඝනකය

(3) ඝනකාභය


- **පහත වචනවලින් නොගැළපෙන වචනය වන්නේ,**

28. (1) යනවා (2) එනවා (3) පිපෙනවා

29. (1) ලොකු (2) රස (3) සුවඳ

- **රූපයට ඉතා සමීප සම්බන්ධයක් දක්වන වචන අඩංගු පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.**

30.




(1) අව්ව - වැස්ස - ආරක්ෂාව

(2) රස්නය - වැස්ස - ආහාර

(3) අව්ව - සල්ලි - ආරක්ෂාව

31.



(1) ආලෝකය - ඉන්ධන - සුන්දර

(2) ඉන්ධන - ආලෝකය - ගින්දර

(3) ඉන්ධන - තිරය - ආරක්ෂාව

- **පහත දක්වා ඇති සංවාදය කියවන්න.**

*ආ...කොහෙද දෙන්නා යන්නේ?*

*අපි යනවා සිහෙලිගෙ ගෙදර. ඔයා මොකද කරන්නේ ?*

*මම චොනිල්කා එනකම් පාසල් යන්න ඉන්නවා*

32. මෙහි කී දෙනෙකු ගැන කියවේ ද?

(1) හතරයි. (2) පහයි. (3) හයයි.

33. මේ දවසේ කුමන වේලාවක් ද?

(1) උදේ (2) දවල් (3) සවස

- **අංක 34 සහ 35 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටස මුල් සිදුවීමට හේතුවක් වේ නම් වරහන තුළ (✓) ලකුණ ද, හේතුවක් නොවේ නම් (×) ලකුණ ද යොදන්න.**

34. මදුරුවන් බෝවීම බහුල වූයේ <u>තැන තැන වතුර රැඳුණු නිසා ය.</u> (........)

35. දෙවිමිණ විභාගය සමත් වූයේ <u>හොඳින් පාඩම් නොකළ නිසා ය.</u> (........)

36. වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $6 \times 3 - 6 = 12$ (2) $4 \times 2 \times 10 = 80$ (3) $6 \times 5 - 7 = 12$

37. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $25 + 35 + 15 = 75$ (2) $15 + 25 + 45 = 65$ (3) $15 + 25 + 55 = 85$

- **ප්‍රශ්න අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පදය වරහනින් තෝරා ලියන්න.**

38. ගංගා ගලා ............................................ (බසියි / බසිති )

39. අක්කා ද මම ද පාසල් ................................ (යන්නෙමි / යන්නෙමු)

40. ඈ ලස්සනට ............................................ (නැටුවා ය. / නැටුවේ ය)

ඇඹිලිපිටිය රාජකීය විද්‍යාලයේ ආචාර්ය
රුවන් ප්‍රසන්න සෙනරත්
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා,
විද්‍යාපීය ප්‍රාථමික පුහුණු බී. ඒ.)

- **කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අගනා දුබල වන මල් ගොමු ඇත  බැද්දේ
තුරු මත කුරුල්ලන්ගේ සුමිහිරි  සද්දේ
මිදුම් පටල පෙර වූ නිල් කඳු  මැද්දේ
සීතල රිදී දිය වැල් පහළට  ඇද්දේ

අවුකන ගල් වෙහෙර ඇත මහ පිළිම  තැනූ
සුකිරි වගෙයි පුත්තලමේ මිදුණු  ලුණු
සීගිරි ගලේ සිතුවම් ලොව පුදුම  වුණු
ආඩම්බරයි ලෝවා මහ පහයෙ  කණු

1. කුරුල්ලන් සුමිහිරි හඬින් ගී ගයන්නේ කොහි සිට ද ?
.......................................................
2. නිල් කඳු පොරවා ගෙන සිටින්නේ මොනවාට ද ?
.......................................................
3. පුත්තලමේ මිදුණු ලුණු උපමා කර ඇත්තේ මොනවාට ද ?
.......................................................
4. "තුරු" යන වචනයට සමාන පදයක් ලියන්න..
.......................................................
5. කවි පෙළෙහි සඳහන් පරිදි ලොව ම පුදුමයට පත් කළේ මොනවා ද ?
.......................................................
6. "සීතල" යන වචනයට විරුද්ධ පදයක් ලියන්න.
.......................................................
7. "දුර්ලභ" යන අදහස ඉදිරිපත් කිරීමට පළමු කවියේ යොදා ඇති වචනය කුමක් ද?
.......................................................
8. ප්‍රාණවාචී බහු වචන අනුක්ත පදයක් කවි වලින් තෝරා ලියන්න.
.......................................................

- **නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.**

09. වලි කුකුළා / වළි කුකුළා

10. විරෝධය / විරෝදය

- **පහත සඳහන් එක් එක් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද එම වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. නංගී සෙල්ලම් කළා ය. ( )

12. බල්ලෝ බුරයි. ( )

13. **පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු ලියන්න.**
මා පිය සහ ගුරු - නැදෑ සොහොයුරු
හැමටම කීකරු - සැපතෙකි මේ දරු

කවියේ සඳහන් පරිදි මෙම දරුවාගේ හොඳ ගතිගුණ ලියන්න.
.......................................................

14. **පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**
සැම / කරමු / ස්ථාන / බෝ වෙන / විනාශ / මදුරුවන් / අපි / එක්වී
.......................................................
.......................................................

- **පහත සඳහන් වැකිවල අර්ථය සිංහලෙන් ලියන්න.**

15. dustbin - .......................................
16. clouds - .......................................

17. **පහත සඳහන් වාක්‍යයෙහි අදහස ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසියෙන් ලියන්න.**
'කරුණාකර ඔබගේ පොත මට දෙන්න'
.......................................................

18. **හිස්තැනට ගැළපෙන අර්ථය ලියන්න.**

i) This is a ........................



19. **පහත සඳහන් වගන්තිය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.**
සුභ උපන්දිනයක් වේවා -
.......................................................

20. **පහත සඳහන් දෙමළ වැකියේ අර්ථය සිංහලෙන් ලියන්න.**
එනක්කු පසික්කිරදු -
.......................................................

- **"මගේ අනාගත බලාපොරොත්තුව" යන මාතෘකාව යටතේ වාක්‍ය පහක් ලියන්න. ලියන ලද සෑම වාක්‍යයක ම වචන 5 කට වැඩි විය යුතුයි. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතුයි.**

21. .......................................................
.......................................................
22. .......................................................
.......................................................
23. .......................................................
.......................................................
24. .......................................................
.......................................................
25. .......................................................
.......................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

26. අකුරෙන් දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.
හතළිස් තුන්දහස් එකසිය පනස් අට
- .......................................................

27. (6 8 9 3 7) රවුම තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව කීයද?
.......................................................

28. 3, 6, 12, 24, ............... හිස් තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.

29. රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.......................

30. 8 + 7 -1 = ..................... ලැබෙන පිළිතුර රෝම සංඛ්‍යාවලින් ලියන්න.

31. ශිෂ්‍යත්ව පන්තියක් පෙ.ව. 10.00ට ආරම්භ වී ප.ව. 3.30 ට අවසන් විය. පන්තිය පැවති කාලය කොපමණ ද?
.......................................................

32. ............... vii ............... හිස් තැන්වලට සුදුසු පරිදි පෙර හා පසු රෝම සංඛ්‍යා ලියන්න.

33. 0.5 භාගයක් ලෙස ලියන්න.
.......................................................

34. අඹ ගොඩක තිබූ අඹ ප්‍රමාණයෙන් $\frac{3}{5}$ නරක් වී තිබුණි. ඉතිරි ඒවා හොඳ අඹ ය. හොඳ අඹ ගෙඩි ප්‍රමාණය 200 ක් නම්, අඹ ගොඩේ තිබුණු මුළු අඹ ප්‍රමාණය කොපමණ ද?
.......................................................

35. ළමයින් 5 දෙනෙකු සහ බලු පැටවුන් තිදෙනෙකු තරඟයට දුවති. මේ සියලු දෙනාට ඇති කකුල් ගණන කීයද?
.......................................................

36. රවුම තුළ ඇති සංඛ්‍යාවලින් 5 හි ගුණාකාර තෝරා ලියන්න.
(5 15 49 30 19 17 20)
.......................................................

37. ශුම්මිගේ කාමරයේ තීන්ත ගෑමට ලීටර 3 ක් අවශ්‍ය විය. තීන්ත මිල දී ගත්තේ ලීටර් භාගයේ ටින් ය. එබැවින් අවශ්‍ය වන තීන්ත ලීටර් භාගයේ ටින් ගණන කීයද?
.......................................................

38. ධාරිතාව 1200*ml* ක් වන භාජනයක ජලය 900*ml* තිබේ. එයට තවත් 900*ml* ක් ජලය වත් කළ විට භාජනයෙන් පිටතට උතුරා යන ජල පරිමාව කොතෙක් ද?

39. ඉඩමකින් $\frac{2}{4}$ ක එළවළු ද, $\frac{1}{4}$ ක පලතුරු ද වගා කර ඇත. වගා කර නැති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කොපමණ කොටසක් ද?

..........................................................................

- **ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

40. ඒක දේශික ශාක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   1. කෙකටිය, බිනර, ගිරිතිල්ල, දෝතලු
   2. දෝතලු, බිනර, කජු, පොල්
   3. අඹ, ගිරිතිල්ල, දෝතලු,පොල්

41. බෝගවලට හානි කරන සත්ත්ව කාණ්ඩ වන්නේ,
   1. වේයා,බළලා
   2. ගොළුබෙල්ලා,දළඹුවා
   3. හාවා, සමනලයා

42. කැටයම් කලාව පිළිබඳව අගනා නිර්මාණ දැකිය හැකි ස්ථානයක් වන්නේ,
   1. සීගිරිය
   2. ඉසුරුමුණි විහාරය
   3. ගල් විහාරය

43. හාල්මැස්සන්වල බහුලව අඩංගු වන්නේ,
   1. ඔක්සිජන්
   2. කැල්සියම්
   3. පිෂ්ඨය

44. පහත වෘත්තීන් අතුරෙන් "පලංචිය" භාවිත කරනු ලබන්නේ,
   1. පෙදෙරේරුවා
   2. කම්මල්කරුවා
   3. ගොවියා

45. මෙම රූපයේ දැක්වෙන්නේ,



   1. මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.
   2. ඇස්. මහින්ද හිමි
   3. අනගාරික ධර්මපාලතුමා

46. "යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගලා.." යන ගීතයෙන් දැක්වෙන විදේශීය ජාතිය වන්නේ,
   1. පෘතුගීසින් 2. ලන්දේසීන්
   3. ඉංග්‍රීසින්

47. සහනශීලි චර්යා නිසා සිදු නොවන දෙයකි.
   1. හැම දෙනාගේ ම ආරක්ෂාව ඇති වීම.
   2. එකිනෙකාගේ ගරුත්වයට හානි සිදු වීම.
   3. වගකීමකින් හැසිරීමට හුරු වීම.

48. අච්චාරු බෙදීමට සුදුසු නොවන්නේ කුමන හැන්ද ද?.
   1. ලී හැන්ද
   2. ඇළුමිනියම් හැන්ද
   3. පොල්කටු හැන්ද

49. ශ්‍රී ලංකාවේ වෙස් මුහුණුවලට ප්‍රසිද්ධ නගරයකි.
   1. තංගල්ල
   2. මහරගම
   3. අම්බලන්ගොඩ

50. ත්‍රිකුණාමලය ආසන්නයෙන් ම මුහුදට වැටෙන ගංගාව කුමක් ද?.
   1. වළවේ ගඟ
   2. කළු ගඟ
   3. මහවැලි ගඟ

51. සීගිරිය අයත් වන දිස්ත්‍රික්කය කුමක් ද?.
   1. දඹුල්ල 2. මාතලේ 3. මහනුවර

52. මෙම රූපයේ සඳහන් නිර්මාණය දැක ගත හැක්කේ,



   1.යාපහුවේ
   2. සීගිරියේ
   3. ගඩොලාදෙණියේ

53. වැවක ජලය පිටකරන ස්ථානය,
   1. වෑකන්ද 2. සොරොව්ව
   3. වැව්තාවුල්ල


54. මෙම දියරවලින් ඉක්මනින් වාෂ්ප වන ද්‍රව වර්ගය වන්නේ.
   1. පෙට්‍රල් 2. පොල්තෙල් 3. ඩීසල්

55. පෙදරේරුවා භාවිත නොකරන උපකරණයකි.
   1. මේසන් හැන්ද 2. බුරුමය
   3. සවල

56. ශ්‍රී ලංකා සිතියමක මහා මාර්ග දැක්වීමට යොදා ගන්නා වර්ණය වන්නේ,
   1. කළු 2. රතු 3. තැඹිලි

57. රත්නපුරය ප්‍රසිද්ධ කුමන කර්මාන්තයක් සඳහා ද?
   1. මැණික් 2. රන් 3. මිනිරන්

58. රූපයෙන් දැක්වෙන ඖෂධීය ශාක පත්‍රය කුමක් ද?



   1. කරපිංචා
   2. කටුවැල් බටු
   3. තිප්පිලි

59. 

මෙම රූපය දැක ගත හැකි වන්නේ,
   1. ඉසුරුමුනියේ දී
   2. යාපහුවේ දී
   3. සීගිරියේ දී

60. උඩරට නැට්ටුවාගේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස සැලකෙන්නේ,
   1. තොවිල් ඇඳුම්
   2. වෙස් ඇඳුම් කට්ටලය
   3. බලියාග ඇඳුම් කට්ටලය

61. ආහාරයට යොදා ගන්නා බීජ වර්ගයකි.
   1. කොස් ඇට
   2. ගස්ලබු ඇට
   3. අඹ ඇට


62. කරමලෙන් හුස්ම ගන්නා සතෙකි.
   1. කිඹුලා 2. ගවයා 3. මාළුවා

63. මෙම රූපයෙන් දැක්වෙන පක්ෂියා වන්නේ,



   1. පරවියා
   2. පැණි කුරුල්ලා
   3. කුකුළා

64. දේශීය සංගීත භාණ්ඩයක් වන්නේ,



1. 2. 3.

65. මේ පස් වර්ග අතුරෙන් සාරවත් පස් වර්ගය වන්නේ,
   1. වැලි පස
   2. ලෝම් පස
   3. මැටි පස

66. "නාම්බුව" යන වචනය යෙදෙන්නේ,
   1. වඩු කර්මාන්තයේ දී
   2. පතල් කර්මාන්තයේ දී
   3. ධීවර කර්මාන්තයේ දී

67. යක් බෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස ගැනෙන්නේ ශ්‍රී ලංකාවේ කුමන නැටුම් සම්ප්‍රදායෙන් ද?
   1. උඩරට නැටුම් සම්ප්‍රදායේය.
   2. සබරගමු නැටුම් සම්ප්‍රදායේය
   3. පහතරට නැටුම් සම්ප්‍රදායේ ය.

68. වැඩිපුර ගංවතුර තර්ජනය ඇති ප්‍රදේශයකි.
   1. ඇඹිලිපිටිය 2. නුවරඑළිය
   3. රත්නපුර

69. පාරේ ගමන් කරන විට සැක කටයුතු යමක් දුටු විට අප දැනුම් දිය යුතු දුරකථන අංකය වන්නේ,
   1. 119 2. 1990 3. 1919

ජනප්‍රිය ශිෂ්‍යත්ව දේශක
රුවන් ප්‍රසන්න සෙනරත්
ඇඹිලිපිටිය ප්‍රාථමික විද්‍යාලය ආචාර්ය
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා
විද්‍යාපීඨ ප්‍රාථමික පුහුණු බි. ඒ.)

